Click & Visit Our Site
ALapiedu.com

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All rights Reserved]

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2025
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2025

කෘෂි විද්‍යාව I
விவசாய விஞ்ஞானம் I
Agricultural Science I

08 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

උපදෙස්:

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන හෝ පිළිතුර තෝරන්න.

01. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් මී මැසි සංවර්ධන ඒකකය පිහිටා ඇත්තේ,

(1) හොරණ (2) බිඳුණුවැව (3) අගලවත්ත
(4) ගන්නෝරුව (5) රහංගල

02. වායුගෝලීය සාපේක්ෂ ආර්ද්‍රතාවය වැඩි වීමෙන් බෝග ශාක වලට සිදුවන බලපෑමක් වන්නේ,

(1) දඬු කැබලි මුල් ඇදීම දුර්වල වේ
(2) අල බෝගවල අස්වැන්න වැඩි වේ
(3) රෝග පළිබෝධ හානි වැඩි වේ
(4) කැපූ මල්වල ගුණාත්මක බව අඩු වේ
(5) ශාකවල උත්ස්වේදන වාෂ්පීකරණය වැඩි වේ

03. කෘෂි පාරිසරික කලාප,

A. වර්ගීකරණයේදී සාමාන්‍ය මාසික වර්ෂාපතනය හා එහි ව්‍යාප්තිය සැලකිල්ලට ගෙන ඇත.

B. අතරමැදි කලාපය තුළ වැඩිම කෘෂි පාරිසරික කලාප ගණනක් ව්‍යාප්තව ඇත.

C. සංකේතවත් කිරීම සඳහා ඉංග්‍රීසි අක්ෂර ත්‍රිත්වයක් හා ඉලක්කමක් අනිවාර්යයෙන් භාවිතා කර ඇත.

ඉහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි වන්නේ,

(1) A පමණි (2) B පමණි
(3) C පමණි (4) A හා B පමණි
(5) B හා C පමණි

04. පාංශු ජනනය සඳහා ප්‍රබල බලපෑමක් ඇතිකරන ප්‍රධාන සාධකය වන්නේ,

(1) වර්ෂාපතනය (2) හිරුට මුහුණලා ඇති දිශාව
(3) කාලය (4) භූමියේ බෑවුම
(5) උච්චත්වය

05. $NO_3 \longrightarrow N_{2(g)}$ මෙම ප්‍රතික්‍රියාව සුලභව සිදුවන්නේ,

(1) ඔක්සිකරණ තත්ත්ව යටතේ දී ය (2) ඔක්සිහරණ තත්ත්ව යටතේ දී ය
(3) උදාසීන pH තත්ත්ව යටතේ දී ය (4) ආම්ලික තත්ත්ව යටතේ දී ය
(5) භාෂ්මික තත්ත්ව යටතේ දී ය

Click & Visit Our Site ALapiedu.com

06. පසක අඩංගු ජල වර්ග පිළිබඳව ප්‍රකාශ දෙකක් පහත දැක්වේ,

A. pF අගය 2.5 සිට 4.5 දක්වා පසේ රැඳී ඇති ජලය කේශාකර්ෂණ ජලයයි.

B. පසක අඩංගු මුළු කේශාකර්ෂණ ජල ප්‍රමාණයම ශාකවලට ලබාගත හැකිය.

ඉහත ප්‍රකාශ අතරින්,

(1) A නිවැරදි වන අතර B වැරදිය

(2) A වැරදි වන අතර B නිවැරදිය

(3) A හා B යන ප්‍රකාශ දෙකම නිවැරදිය

(4) A නිවැරදි වන අතර B මඟින් වඩාත් පැහැදිලි කරයි.

(5) A හා B ප්‍රකාශ දෙකම නිවැරදි වන අතර A මඟින් B පැහැදිලි කරයි

07. පාංශු ලක්ෂණ පිළිබඳව ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. දුර්වල ව්‍යුහයක් සහිත පසකට කාබනික ද්‍රව්‍ය එකතු කිරීමෙන් ව්‍යුහය දියුණු වේ.

B. සුසංහනය වූ පසක දෘෂ්‍ය ඝනත්වය වැඩිවේ.

C. බිම් සැකසීමෙන් පසුව පසේ සත්‍ය ඝනත්වය වැඩිවේ.

D. සෞඛ්‍යවත් පසක ඉහළ ක්ෂුද්‍රජීවී ගහනයක් ජීවත් වේ.

ඉහත ප්‍රකාශ අතරින් වඩාත් නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ වන්නේ,

(1) A පමණි

(2) A හා B පමණි

(3) A,C,D පමණි

(4) A,B, Cපමණි

(5) A හා D පමණි

08. ශාක පෝෂක අවශෝෂණය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - ශාක පෝෂක අවශෝෂණය ප්‍රධාන ආකාර දෙකකට සිදු වේ.

B - ශාකයට සයනයිඩ් යෙදූවිට පෝෂක අවශෝෂණය ඇණ හිටී.

ඉහත ප්‍රකාශ අතුරින්,

(1) A නිවැරදි වන අතර B වැරදිය

(2) B නිවැරදි වන අතර A වැරදිය

(3) A නිවැරදි අතර B මඟින් එය පැහැදිලි කරයි

(4) B නිවැරදි අතර A මඟින් එය පැහැදිලි කරයි

(5) A හා B ප්‍රකාශ දෙකම නිවැරදිය

09. වී බෝගයේ පත්‍ර ක්ෂේත්‍රඵලය හා පඳුරු දැමීම වැඩි කිරීමට අවශ්‍ය වන ප්‍රධාන පෝෂකයක් වන්නේ,

(1) N (2) P (3) K (4) Mo (5) Fe

10. ජෛව ගතික ගොවිතැනේ දී භාවිතා කරන ජෛව පොහොර සෑදීමට යොදා ගන්නා පොස්පරස් ද්‍රාව්‍යතාවය වැඩි කරන බැක්ටීරියාවන් වන්නේ,

(1) *Bacillus spp.* හා *Pseudomonas*

(2) *Azotobacter* හා *Clostridium*

(3) *Azospirillum* හා *Pseudomonas*

(4) *Penicillium* හා *Aspergillus*

(5) *Rhizobium* හා *Azospirillum*

11. බීජාවරණය සීරීම හා ජලයේ පෙඟවීම යන බීජ ප්‍රතිකර්ම වඩාත් උචිත වන්නේ,

(1) අඹ (2) තක්කාලි (3) දඹල (4) බෝංචි (5) තේක්ක

Click & Visit Our Site
ALapiedu.com

12. ශුන්‍ය බිම් සැකසීම සිදුකළ භූමියක් සම්බන්ධව නිවැරදි ප්‍රකාශය වන්නේ,

(1) බීජ ප්‍රරෝහණය වීමේ සම්භාවිතාවය වැඩිය
(2) බිම් සැකසීමට යන වියදම වැඩිය
(3) ගොවිපළ යන්ත්‍ර නිසා සිදුවන සුසංහනය වැඩිය
(4) පාංශු හා ජල සංරක්ෂණ හැකියාව වැඩිය
(5) වාතනය හා ජල වහනය වීමේ සම්භාවිතාවය වැඩිය

13. කෙටි කාලීන වී ප්‍රභේද සඳහා වඩාත් සුදුසු තවාන් ආකාරය වනුයේ,

(1) මඩ තවාන්
(2) ගොඩ තවාන්
(3) පැරශූට් තවාන්
(4) ඩැපොග් තවාන්
(5) සංගත තවාන්

14. කේන්ද්‍රාපසාරී පොම්ප පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A. කේන්ද්‍රාපසාරී පොම්ප, සපයන ජලයේ පීඩනය වැඩි කිරීමට යොදාගත හැක.

B. කේන්ද්‍රාපසාරී පොම්පවල ඉම්පෙලරය භ්‍රමණය කිරීමට විදුලි මෝටරයක් අත්‍යාවශ්‍ය වේ.

C. කේන්ද්‍රාපසාරී පොම්ප මගින් ඉහළ උසකට ජලය පොම්ප කළ හැක.

ඉහත ප්‍රකාශ අතරින් නිවැරදි වන්නේ,

(1) A පමණි
(2) B පමණි
(3) A හා B පමණි
(4) A හා C පමණි
(5) A, B හා C පමණි

15. ස්වාභාවික, පෘෂ්ඨීය ජල ප්‍රභව පමණක් අඩංගු වරණය වන්නේ,

(1) ගංගා සහ වැව්
(2) ගංගා සහ ආටිසියානු ළිං
(3) කෘෂි ළිං හා ගංගා
(4) ගංගා සහ ඇළ දොළ
(5) කෘෂි ළිං හා විල්ලු

16. දුර්වල ජල වහනය නිසා සෘජුවම ශාකවලට ඇති කරන බලපෑමක් වන්නේ,

(1) කාබනික ද්‍රව්‍ය වියෝජනය සෙමින් සිදු වීම
(2) පොටෑසියම් හා පොස්පරස් වැනි පෝෂක අවශෝෂණය සිදු නොවීම
(3) පාංශු වාතනය දුර්වල වීම
(4) නිර්වායු තත්ත්ව යටතේ ඇති වන විෂ වායූන් මගින් පාංශු විෂ බව ඇති වීම
(5) පසේ ලවණතාව වර්ධනය වීම

17. C4 ශාකවල,

(1) ප්‍රභා ක්‍රියාවලියේ දී CO_2 එක් වරක් පමණක් තිර වේ.
(2) ඉහළ උෂ්ණත්ව වලදී ප්‍රභාසංස්ලේෂණ වේගය දුර්වල වේ.
(3) ප්‍රභාසංස්ලේෂණයේ ප්‍රථම ස්ථායි ඵලය ලෙස C_3 සංයෝගයක් සෑදේ.
(4) ජල භාවිත කාර්යක්ෂමතාවය අඩුය.
(5) ඵලදාව C_3 ශාක වලට වඩා වැඩිය.

Click & Visit Our Site
ALapiedu.com

18. 57g ස්කන්ධයක් සහිත බිත්තරයක් දින 21ක කාලයක් කෘත්‍රිමව රක්කවීමෙන් අනතුරුව ඉපදෙන කුකුළු පැටවෙකු ගේ සාමාන්‍ය ශරීර බර වන්නේ,

(1) 55g (2) 25g (3) 70g (4) 38g (5) 60g

19. බෝගයක වර්ධන පරාමිති පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ. ඒ හා සම්බන්ධ ප්‍රකාශ අතුරින් නිවැරදි පිළිතුර වන්නේ,

A – ශාක සෛල විභාජනය හා විශාල වීම හේතුවෙන් ශාක වර්ධනය සිදුවේ.

B – පත්‍ර ක්ෂේත්‍රඵල දර්ශකය ප්‍රභාසංස්ලේෂණ සීඝ්‍රතාවයට අනුලෝමව සමානුපාතික වේ.

(1) A සත්‍ය වන අතර B අසත්‍ය වේ

(2) A අසත්‍ය වන අතර සත්‍ය වේ.

(3) A සත්‍ය වන අතර B මගින් එය තවදුරටත් පැහැදිලි කරයි

(4) B සත්‍ය වන අතර A මගින් B ප්‍රකාශය තහවුරු කරයි

(5) A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වේ. එම ප්‍රකාශ දෙක අතර සම්බන්ධයක් නැත

20. ඉඟුරු, අන්නාසි, ඇණු, ස්ට්‍රෝබෙරි යන ශාක ප්‍රචාරණයට භාවිතා කරන ප්‍රචාරක ව්‍යුහ ඇතුළත් නිවැරදි ගැලපීම වනුයේ,

(1) බල්බ, කෝම, රෛසෝම, මොරෙයියන්
(2) රෛසෝම, මොරෙයියන්, බල්බ, ධාවක
(3) රෛසෝම, මොරෙයියන්, බල්බිල, ධාවක
(4) කෝම, මොරෙයියන්, බල්බිල, ධාවක
(5) ආකන්ධ, මොරෙයියන්, බල්බ, ධාවක

21. බීජ ප්‍රරෝහණය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - බීජ ප්‍රරෝහණයේ මුල්ම පියවර වන්නේ අනුද්වාරය තුළින් බීජය තුළට ජලය ඇතුළු වීමයි.

B - අධෝභෞම ප්‍රරෝහණයේ දී බීජාධරය සීඝ්‍රයෙන් වර්ධනය වීම හේතුවෙන් බීජ පත්‍ර පොළොව තුළ රැඳේ.

C - කඩල බීජ අපිභෞම ප්‍රරෝහණයක් දක්වන බීජ සඳහා උදාහරණයකි

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වනුයේ,

(1) A පමණි
(2) B පමණි
(3) C පමණි
(4) A හා C පමණි
(5) B හා C පමණි

22. රූප සටහනේ පෙන්වා දී ඇති උපකරණය භාවිතා කරනු ලබන්නේ,



(1) රෝපණ ද්‍රව්‍ය ජීවාණුහරණය
(2) වීදුරු භාණ්ඩ ජීවාණුහරණයට
(3) ඩැහි අඩු හා පිහි ජීවාණුහරණයට
(4) රෝපණ මාධ්‍ය ජීවාණුහරණයට
(5) හෝර්මෝන හා විටමින් ජීවාණුහරණයට

23. ශ්‍රී ලංකාවේ පහතරට ප්‍රදේශ වල පොලිතීන් ගෘහයක් ඉදිකිරීමේදි එය දිශානත කළ යුතු නිවැරදි දිශාව වන්නේ,

(1) ඊශාන - නැගෙනහිර
(2) උතුර - දකුණ
(3) වයඹ - ගිණිකොණ
(4) නැගෙනහිර - බටහිර
(5) නිරිත - ඊශාන

AL අපි Click & Visit Our Site ALapiedu.com

24. ශාක අතු බැඳීම පිළිබඳ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ,

A - මව් ශාකයට සම්බන්ධව තිබියදීම අතු වල මුල් ඇද්දවීම සඳහා වඩාත් බහුලව භාවිතා කරන ක්‍රමය අතු බැඳීමයි

B - අතුබැඳීමේ ක්‍රියාවලියේ දී කැපුම් ස්ථානයේ C:N අනුපාතය අඩුවීම සිදුවේ.

ඉහත ප්‍රකාශ අතුරින්,

(1) A නිවැරදි වන නමුත් B වැරදිය.

(2) A වැරදි නමුත් B නිවැරදිය

(3) A හා B දෙකම නිවැරදි අතර A මගින් B තවදුරටත් පැහැදිලි කරයි

(4) A හා B දෙකම නිවැරදි අතර B මගින් A තවදුරටත් පැහැදිලි කරයි

(5) A හා B දෙකම නිවැරදි වන අතර ප්‍රකාශ අතර සම්බන්ධතාවයක් නැත

25. පහත ප්‍රකාශ සලකා බලන්න.

A - යම් ලක්ෂණයක් ප්‍රකාශ වීමට ඇලීලික ජාන යුගලක් බලපායි.

B - බෝග ශාකවල ලක්ෂණ සඳහා බලපාන වර්ණදේහ සෑම විටම ස්වාධීනව සංරචනය වේ.

C - පරම්පරා අන්තරය වැඩි බෝග වර්ගවල දෙමුහුම් දිරිය වැඩිය

මෙම ප්‍රකාශ අතුරින්,

(1) A පමණක් නිවැරදිය

(2) B පමණක් නිවැරදිය

(3) A හා C පමණක් නිවැරදිය

(4) B හා C පමණක් නිවැරදිය

(5) A,B,C සියල්ලම නිවැරදිය

26. මුල් ගිල්වූ වගාවක පෝෂණ ද්‍රාවණයේ විද්‍යුත් සන්නායකතාවය 5ds/m විය. පහත ප්‍රකාශ සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ,

(1) ක්ලෝරීන් අඩංගු ජලය එක් කිරීම කළ යුතුයි

(2) පිරිසිදු ජලය එක් කළ යුතුයි

(3) තනුක H_2SO_4 එක් කළ යුතුයි

(4) තනුක NaOH එක් කළ යුතුයි

(5) එම එස් මාධ්‍ය එකතු කිරීම කළ යුතුයි

27. රූපයේ දැක්වෙන කෘමි නොවන පළිබෝධකයා හානි සිදු කරන බහුවාර්ෂික ශාකයක් වන්නේ,



(1) මිරිස්

(2) ගෝවා

(3) පොල්

(4) ස්ට්‍රෝබෙරි

(5) ඇන්තූරියම්

28. ඇටවරා, කලාඳුරු වැනි මර්ධනයට අපහසු වල් පැළෑටි පාලනයට වඩාත් සුදුසු වන්නේ,

(1) ස්පර්ශ වල් නාශක යෙදීම යි

(2) පරිසර්පන වල් නාශක යෙදීම යි

(3) තෝරා නසන වල් නාශක යෙදීම යි

(4) වායව කොටස් ඉවත් කිරීම යි

(5) අතින් ගලවා ඉවත් කිරීම යි

Click & Visit Our Site
ALapiedu.com

29. Blotter test මගින්,

(1) *Pyricularia orizae* කොනිඩි බීජාණු හඳුනාගනියි
(2) *Pseudomonas* බීජාණු හඳුනා ගනියි
(3) *Bacillus anthracis* බීජාණු හඳුනා ගනියි
(4) *Geobacillus spp.* වල බීජාණු හඳුනා ගනියි
(5) *Clostridium spp.* බීජාණු හඳුනා ගනියි

30. ආගන්තුක ආක්‍රමණශීලී ශාක මගින් මෙරට ජෛව පද්ධති සමතුලිතතාවයට සිදුකරනු ලබන බලපෑමක් වන්නේ,

(1) බෝගවල විභව අස්වැන්න අඩු කිරීමට දායක වේ
(2) වගා ක්ෂේත්‍ර වල වල් මර්ධනයට අධික වියදමක් වැයවේ
(3) මිනිසාගේ සෞඛ්‍යයට බලපෑම් ඇති වේ
(4) අනෙකුත් ශාක මත ඇති කරන බලපෑම අධික වී ඒවා විනාශ වීම සිදුවේ
(5) වගා ක්ෂේත්‍රයේ වැඩ කටයුතු කිරීම අපහසු වේ

31. පූර්ණ රූපාන්තරණයක් සහිත කෘමියෙකුගේ ජීවන චක්‍රයේ අවස්ථා අතරින් ස්වාභාවික තත්ත්ව යටතේ ඉහළම මරණ ප්‍රතිශතයක් දක්නට ලැබෙන්නේ,

(1) බිත්තර අවස්ථාවේ දීය
(2) කීට අවස්ථාවේ දී ය
(3) පිළා අවස්ථාවේ දී ය
(4) සුහුඹුල් අවධියේ දී ය
(5) ශිෂු අවස්ථාවේ දී ය

32. ආහාරයක ඔක්සිහාරක සීනි හා ඇමයිනෝ අම්ල ප්‍රතික්‍රියාව හේතුවෙන් ආහාරයක් දුඹුරු පැහැවීම හඳුන්වනු ලබන්නේ,

(1) මෙලාඩ් ප්‍රතික්‍රියාවයි
(2) කැරමලීකරණයයි
(3) ජලවිච්ඡේදනයයි
(4) මුඩුවීමයි
(5) ඔක්සිහරණයයි

33. ආහාර පරිරක්ෂණයේදී අක්‍රිය කිරීමේ මූලධර්මය යොදාගන්නා අවස්ථාවක් සඳහා නිදසුනක් වන්නේ,

(1) වියළීම
(2) අධිශීතනය
(3) පැස්ටරීකරණය
(4) පැසවීම
(5) සාන්ද්‍රීකරණය

34. කාලය සහ රඹුටන් ගෙඩි වල වර්ධනය හා සංවර්ධනය පහත ප්‍රස්ථාරයේ දැක්වේ



රඹුටන් නෙළිය යුතු අවස්ථාව වන්නේ,

(1) A අවධිය අවසානයේ දී ය
(2) B අවධිය මැද දී ය
(3) C අවධියට එළඹීමෙන් පසුව ය
(4) D අවධිය අවසානයේ දී ය
(5) B අවධියේ දී ය

Click & Visit Our Site
ALapiedu.com

35. තම්බන ලද සහල් පිළිබඳ ශිෂ්‍යයෙක් විසින් පහත කරුණු ලැයිස්තු ගත කරන ලදී.

A - වී බීජයේ ඇති ප්‍රෝටීන හා ඛනිජ ධාන්‍ය තුළට අවශෝෂණය වන නිසා පෝෂක සංඝටක ආරක්ෂා වේ

B - තැම්බූ සහල් වල ජීව කාලය දිගු වේ

C - ධාන්‍ය කැඩෙන ප්‍රතිශතය වැඩි බැවින් කෘමි හානි අධික වේ.

ඉහත ප්‍රකාශ අතුරින් සාවද්‍ය වන්නේ,

(1) A පමණි
(2) B පමණි
(3) C පමණි
(4) B හා C පමණි
(5) A හා C පමණි

36. ගවයාගේ රූමනය පිළිබඳව සත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) මුළු ආමාශයේ ධාරිතාවයෙන් හරි අඩක් රූමනය අයත් කර ගනී.
(2) රූමන බිත්තියේ ජීර්ණක එන්සයිම නිපදවන ග්‍රන්ථි රාශියක් පවතී.
(3) රූමනයේ pH අගය ආම්ලික හෝ භාෂ්මික විය හැකිය.
(4) රූමනයේ අභ්‍යන්තර බිත්තියේ පේශිමය නෙරුම් රාශියක් පිහිටයි.
(5) රූමන බිත්තිය මතුපිට මී වදයක හැඩැති ව්‍යුහ රාශියක් පිහිටයි.

37. වසු පැටවෙකු කිරි වැරීම සිදුකළ යුත්තේ,

(1) රළු ආහාර සම්පූර්ණයෙන්ම ආහාරයට ගන්නා විට
(2) පැටවාගේ වයස මාස 10 -12 වන විට
(3) මවගෙන් කිරි උරා බීම ප්‍රතික්ෂේප කරන විට
(4) උපත් බර මෙන් ශරිර බර දෙගුණයක් වූ විට
(5) වසු පැටවා නියුමෝනියාව රෝගයෙන් පෙළෙන විට

38. එළදෙනකගේ වර්ධනය වන ග්‍රාපීය ස්‍යූනිකාව මඟින් නිපදවන හෝර්මෝනය වන්නේ,

(1) ස්‍යූනිකා උත්තේජක හෝර්මෝනය
(2) ලුටෙයිනිකාරක හෝර්මෝනය
(3) ප්‍රොජෙස්ටරෝන් හෝර්මෝනය
(4) ප්‍රොලැක්ටින් හෝර්මෝනය
(5) ඊස්ට්‍රජන් හෝර්මෝනය

39. ගව රෝග වර්ගීකරණයේ දී ආසාදිත නොවන රෝගයක් වන්නේ,

(1) ගව රක්තාශ්‍රවය
(2) කුර හා මුඛ රෝගය
(3) බඩ පිපුම
(4) කිණිතුලු උණ
(5) බෲසෙල්ලෝසිස්

40. ඉහළ බිත්තර නිෂ්පාදනයක් සහිත කිකිළියකගේ ලක්ෂණයක් වන්නේ,

(1) විශාල ප්‍රමාණයේ ශරීරයක් තිබීම
(2) බිත්තර රකීමට පෙළඹීම
(3) වැඩි ආහාර පරිවර්තන අනුපාතයක් තිබීම
(4) අඩු ආහාර පරිවර්තන අනුපාතයක් තිබීම
(5) බිත්තර දැමීම ආරම්භ කිරීමට දිගු කාලයක් ගත කිරීම

41. බිත්තරයක් සඳහා ඉල්ලුම් ශ්‍රිතය $Qd = 120 - 2P$ වන අතර සැපයුම් ශ්‍රිතය $Qs = 20 + 3P$ වේ. P යනු මිල (රුපියල්) සහ Q යනු ප්‍රමාණය (ඒකක) වේ. සමතුලිත මිල වන්නේ?

(1) රු.15 (2) රු.20 (3) රු.25 (4) රු.30 (5) රු.35

Click & Visit Our Site
ALapiedu.com

42. සත්ත්ව ආහාරයට පිටතින් එකතු කරනු ලබන ආකලන ද්‍රව්‍ය පිළිබඳව ප්‍රකාශ දෙකක් පහත දැක්වේ.

A - ආකලන ද්‍රව්‍ය පෝෂක සංඝටක නොවන නමුත් ආහාරයක ඇතුළත් විය යුතුය.

B - ගොවිපළ සතුන්ට වැළඳෙන රෝග වලින් ආරක්ෂාවට ඖෂධීය ආකලන වැදගත් වේ.

මෙම ප්‍රකාශවලින්,

(1) A නිවැරදි වන අතර B වැරදිය

(2) B නිවැරදි වන අතර A වැරදිය

(3) A හා B යන ප්‍රකාශ දෙකම නිවැරදිය

(4) A නිවැරදි වන අතර එය B මගින් තවදුරටත් පැහැදිලි කරයි

(5) B නිවැරදි වන අතර එය A මගින් තවදුරටත් පැහැදිලි කරයි

43. පහත ප්‍රස්ථාරයේ දැක්වෙන සංසිද්ධිය සිදුවීමට හේතුව විය හැක්කේ,



(1) ආදේශක භාණ්ඩවල මිල වැඩි වීම

(2) අනුපූරක භාණ්ඩවල මිල අඩු වීම

(3) පාරිභෝගිකයාගේ ආදායම අඩුවීම

(4) පාරිභෝගිකයාගේ රුචිය වැඩි වීම

(5) අනාගත මිල වැඩිවේ යැයි අපේක්ෂා කිරීම

44. තාර්කික නිෂ්පාදකයෙකුගේ ගොවිපළක සම නිෂ්පාදන වක්‍රයක් පහත ප්‍රස්ථාරයෙන් දැක්වේ. එහි $\Delta L/\Delta M$ අනුපාතය මගින් දැක්වෙන්නේ,



(1) ආන්තික ශිල්පීය ආදේශන අනුපාතය යි

(2) ආන්තික ආදායම් අනුපාතය යි

(3) ආන්තික වියදම් අනුපාතය යි

(4) සාමාන්‍ය විචල්‍ය වියදම් අනුපාතය යි

(5) මිල සැපයුම් නම්‍යතා අනුපාතය යි

45. සැපයුම් දාම කළමනාකරණය (Supply Chain Management) ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන්නේ කුමක් කෙරෙහිද?

(1) නව නිෂ්පාදන සංවර්ධනය.

(2) පාරිභෝගික සේවා වැඩි දියුණු කිරීම.

(3) භාණ්ඩ හා සේවා ගලා යාම කාර්යක්ෂමව කළමනාකරණය කිරීම.

(4) සේවක අවශ්‍යතා හඳුනාගැනීම, පුහුණුව හා සංවර්ධනය.

(5) තරඟකරුවන් විශ්ලේෂණය කිරීම.

Click & Visit Our Site
ALapiedu.com

46. කර්මාන්ත ශාලාවක භාවිතා වන යන්ත්‍ර සූත්‍ර, ගොඩනැගිලි සහ උපකරණ අයත් වන්නේ කුමන නිෂ්පාදන සාධක ගණයටද?

(1) මානව ප්‍රාග්ධනය
(2) මූල්‍ය ප්‍රාග්ධනය
(3) භෞතික ප්‍රාග්ධනය
(4) ස්වභාවික සම්පත්
(5) ශ්‍රමය

47. කාබනික ගොවිතැනට පදනම් වන පරිසර විද්‍යා මූලධර්මයක් වන්නේ,

(1) කල් යල් බලා ගොවිතැන් කටයුතු ආරම්භ කිරීම
(2) මිනිසාගේ සෞඛ්‍ය ප්‍රතිසමය පිළිබඳ සලකා බැලීම
(3) සෞඛ්‍ය සම්පන්න ආහාර මිනිසාට මෙන්ම සතුන්ටත් ලැබීම
(4) සියළුම පරම්පරා වල ආරක්ෂාකාරී බව තහවුරු වීම
(5) සජීවී පරිසර පද්ධතිය හා ස්වාභාවික චක්‍ර මත පදනම් වීම

48. පහත රූපයේ දැක්වෙන්නේ සංරක්ෂණ ගොවිතැනේ එක්තරා උප පද්ධතියකි. එම පද්ධතියෙන් ලැබෙන සුවිශේෂී සේවාවක් වන්නේ,



(1) සංකීර්ණ ශාක සැකැස්ම
(2) විවිධ ආර්ථික නිෂ්පාදන ලැබීම
(3) ජල පෝෂක ප්‍රදේශ හා භූමියේ පැවැත්ම තිරසාර වීම
(4) දිගුකාලීනව පස හායනයට ලක් වීම
(5) බෑවුම් සහිත භූමි වලට පමණක් යොදා ගත හැකි වීම

49. ජාන විකරණය පිළිබඳ ප්‍රකාශ දෙකක් පහතින් දක්වා ඇත.

A - ජාන විකරණ කළ ආහාර පරිභෝජනයෙන් පුද්ගලයෙකුට ආසාත්මිකතා ඇතිවීමට හැකියාවක් ඇත.

B - ජාන විකරණය කළ ආහාර නිෂ්පාදනය කොට යම් රටක වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමේ දී මිනිසාට සෞඛ්‍යමය හා සමාජීය ගැටලු ඇති වීමට හැකියාවක් ඇත.

මෙම ප්‍රකාශ අතුරින්,

(1) A නිවැරදිය B වැරදිය
(2) B නිවැරදිය A වැරදිය
(3) A නිවැරදි වන අතර B මගින් එය පැහැදිලි කරයි
(4) B නිවැරදි වන අතර A මගින් එය පැහැදිලි කරයි
(5) A හා B ප්‍රකාශ දෙකම නිවැරදිය

50. කෘෂිකර්මාන්තය ආශ්‍රිතව බහුලව දැකිය හැකි බැක්ටීරියා මගින් ඇතිවන සංක්‍රමණික රෝග ඇතුළත් පිළිතුර වන්නේ,

(1) බෲසෙල්ලෝසිස් හා සූකර උණ
(2) ක්ෂය රෝගය හා මී උණ
(3) මී උණ හා කුරුළු උණ
(4) කුරුළු උණ හා ක්ෂය රෝගය
(5) බෲසෙල්ලෝසිස් හා කුරුළු උණ

* * * *

Click & Visit Our Site
ALapiedu.com

සියලු ම හිමිකම් ඇවිරිණි /முழுப் பதிப்புரிமை

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2025
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2025

කෘෂි විද්‍යාව II
விவசாய விஞ்ஞானம் II
Agricultural Science II

08 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීමේ කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம்- 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීමේ කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

විභාග අංකය: ....

උපදෙස් :

- මෙම ප්‍රශ්න පත්‍රය පිටු 12 කින් සමන්විත වේ.
- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන් විත වන අතර කොටස් දෙකටම නියමිත කාලය පැය තුනකි.

A කොටස - ව්‍යුහගත රචනා (පිටු අංක 01 -11)

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම සපයන්න.
- ඔබේ පිළිතුරු, ප්‍රශ්න පත්‍රයේ ඉඩ සලසා ඇති තැන්වල ලිවිය යුතු ය. මේ ඉඩ ප්‍රමාණය පිළිතුරු ලිවීමට ප්‍රමාණවත් බව ද දීර්ඝ පිළිතුරු බලාපොරොත්තු නොවන බව ද සලකන්න.

B කොටස - රචනා (පිටු අංක 12)

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න. සම්පූර්ණ ප්‍රශ්න පත්‍රයට නියමිත කාලය අවසන් වූ පසු A සහ B කොටස් එක් පිළිතුරු පත්‍රයක් වන සේ A කොටස උඩින් අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.
- ප්‍රශ්න පත්‍රයේ B කොටස පමණක් විභාග ශාලාවෙන් පිටතට ගෙන යාමට ඔබට අවසර ඇත.

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා පමණි.

(08) කෘෂි විද්‍යාව -II		
කොටස	ප්‍රශ්න අංකය	ලැබූ ලකුණු
A	1	
	2	
	3	
	4	
B	5	
	6	
	7	
	8	
	9	
	10	
එකතුව		

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරෙන්	

සංකේත අංක

උත්තර පත්‍ර පරීක්ෂක 1	
උත්තර පත්‍ර පරීක්ෂක 2	
ලකුණු පරීක්ෂා කළේ	
අධීක්ෂණය කළේ	

Click & Visit Our Site
ALapiedu.com

මෙම තීරයේ කිසිවක් නොලියන්න

A කොටස - ව්‍යුහගත රචනා

සියලුම ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.

(එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 100 කි)

01 A යුරෝපීය ජාතිකයෝ වාණිජ අවශ්‍යතා මුල් කරගනිමින් ශ්‍රී ලංකාවට පැමිණ, වාණිජ කෘෂි කර්මාන්තය ස්ථාපිත කර ගත්හ.

i) ලන්දේසී පාලන සමයේ ප්‍රධාන කෘෂි නිෂ්පාදන 02ක් නම් කරන්න.

a. ....

b. ....

ii) වැවිලි කෘෂිකර්මාන්තය නිසා කෘෂි ආර්ථිකයට සිදු වූ හිතකර බලපෑම් 02ක් ලියන්න.

a. ....

b. ....

B පාෂාණ ජීරණයට ලක්වීමෙන් පසුව මාතෘ ද්‍රව්‍යයත් ඒවා පාංශු ජනනයට භාජනය වීමෙන් පසත් ඇති වේ.

i) පාෂාණ ඇතිවන ආකාරය අනුව ප්‍රධාන කොටස් 03 සඳහන් කර ඒවාට එක් උදාහරණය බැගින් සඳහන් කරන්න.

පාෂාණ වර්ගය	උදාහරණ
....	....
....	....
....	....

ii) පහත සඳහන් එක් එක් ඛනිජ වර්ගය පසට ලැබෙන්නේ කුමන පාෂාණ වර්ගය / වර්ග ජීරණය වීමෙන් ද යන්න සඳහන් කරන්න.

ප්‍රාථමික ඛනිජ ....

ද්විතියික ඛනිජ ....

C දැනට ශ්‍රී ලංකාවේ පවතින වගා කළ හැකි ඉඩම් බොහොමයක පාංශු සෞඛ්‍ය පිරිහී ඇත.

i) පාංශු සෞඛ්‍ය පිරිහීමට බලපාන ස්වාභාවික හේතුවක් සඳහන් කරන්න.

....

ii) පාංශු සෞඛ්‍ය හා එහි ගුණාත්මකබව දියුණු කළ හැකි ප්‍රධාන ක්‍රම දෙකක් සඳහන් කරන්න.

....

....

D වර්තමාන ගොවීන් ආනයනික බීජ රෝපණ ද්‍රව්‍ය ලෙස සුලභව භාවිතා කිරීම තුළින් දේශීය කෘෂිකර්මාන්තයට බලපාන ගැටළු දෙකක් සඳහන් කරන්න.

....

....

AL අපි Click & Visit Our Site ALapiedu.com

මෙම තීරයේ කිසිවක් නොලියන්න

E කොම්පෝස්ට් පොහොර වගා කෂේත්‍රයට යෙදමෙන රසායනික පොහොර භාවිත කාර්යක්ෂමතාවය වැඩිවේ.



ඉහත ප්‍රස්ථාරයේ B,C,D,E අවස්ථා නම් කරන්න.

B ....

C ....

D ....

E ....

ii) B අවධියේ දී සිදුවන අවසාන කොම්පෝස්ට් වල ගුණාත්මය තීරණය වන ක්‍රියාවලි දෙකක් නම් කරන්න.

....

....

iii) A අවස්ථාවේ දි පැවතිය යුතු උෂ්ණත්වය සඳහන් කරන්න.

....

iv) A හිදී එම උෂ්ණත්වය පවත්වා ගැනීම කොම්පෝස්ට් ජීරණ ක්‍රියාවලියට ඇති වැදගත්කම සඳහන් කරන්න.

....

....

F පුද්ගලයෙකුට උපද්‍රවයක් ඇති කිරීමට විභවතාවයක් ඇති ඕනෑම දෙයක් ආපදාවකි. ආපදා සම්බන්ධව පහත ප්‍රකාශයන්හි **සත්‍ය** /**අසත්‍ය** බව සඳහන් කරන්න.

ප්‍රකාශය	සත්‍ය වේ/ අසත්‍ය වේ
i) අධ්‍යාතතිය අධික ශබ්දය හා කම්පන නිසා ඇති වේ	....
ii) කෘමි දෂ්ඨ කිරීම් හේතුවෙන් ඇතිවන ආපදා රසායනික ආපදා කාණ්ඩයට අයත් වේ	....
iii) විජලනය යනු භෞතික ආපදා ආකාරයකි	....
iv) සර්ප දෂ්ටන වියළි කලාපයේ බහුලව දැකිය හැකි ආපදාවකි	....

AL අපි
Click & Visit Our Site
ALapiedu.com

මෙම තීරයේ කිසිවක් නොලියන්න

G බෝග දෙකක් හෝ වැඩ ගණනක එකම ක්ෂේත්‍රයෙ එකම කාලය තුළ හෝ වර්ෂයක් තුළ වගා කිරීම බහු බෝග වගාවයි.


P


Q



R

i) ඉහත රූප සටහන්වලින් දක්වා ඇති බහු බෝග වගා ක්‍රම නම් කරන්න.

P ....

Q ....

R ....

ii) P රූප සටහනේ දැක්වෙන බහු බෝග වගාව යෙදෙන අවස්ථා 02ක් සඳහන් කරන්න.

b) ....

c) ....

iii) ii හි ඔබ සඳහන් කළ මිශ්‍ර බෝග වගාව තිරසාර කෘෂිකර්මාන්තයට දායක වන ආකාර ලියන්න.

a) ....

b) ....

iv) R වගා ක්‍රමය සඳහා පළමු බෝගය බඩ ඉරිඟු වන විට දෙනව බෝගය සඳහා සුදුසු රනිල බෝගයක් යොජනා කරන්න.

....

02 A වගා බිමෙහි සංස්ථාපනය සඳහා නිරෝගී පැළ ලබා ගැනීම සඳහා තවාන් කළමණාකරණය ඉතා වැදගත් වේ. ගොවීන් කණ්ඩායමක් විසින් තවාන් සම්බන්ධ ක්‍රියාවලියක නිරතවන ආකාරය මෙම ඡායාරූපයෙන් දැක්වේ

i) මෙම ක්‍රියාවලිය හඳුන්වන්න.

....

ii) මෙම ක්‍රියාවලියේ වැදගත්කම කුමක්ද?

....

Click & Visit Our Site
ALapiedu.com

මෙම තීරයේ කිසිවක් නොලියන්න

iii) මෙම ක්‍රමය හැර මෙම ප්‍රතිඵලය ලබා ගැනම සඳහා යොදාගත හැක වෙනත භෞතික ක්‍රම 03ක් නම් කරන්න.

....

....

....

B එක් ජීවන ප්‍රවෘත්තියක අවසානය තවත් ජීවන චක්‍රය ක ආරම්භය බීජය මගින් සනිටුහන් කරයි.



i) ඉහත රූප සටහනේ a,b,c,d ලෙස දක්වා ඇති කොටස් නම් කරන්න.

a ....   b ....

c ....   d ....

C වර්ධක ප්‍රචාරණය යනු ජන්මාණු හා වීමකින් තොරව වර්ධක කොටස්වලින් ශාකයක් ප්‍රචාරණය කිරීමයි. පහත දක්වා ඇති බෝග සඳහා වඩාත් සුදුසු කෘතිම වර්ධක ප්‍රචාරණ ක්‍රමය සඳහන් කරන්න.

i) අඹ ....   ii) කෙසෙල් ....

iii) ලෙමන් ....   iv) ජම්බු ....

v) දොඩම් ....

D බද්ධ පලතුරු පැළ වඩාත් සාර්ථකව ක්ෂේත්‍රයේ ස්ථාපනය කළ හැකිවේ.

i) බද්ධ කිරීමේ සාර්ථකත්වය සඳහා බලපාන පුද්ගල බද්ධ සාධක 02ක් ලියන්න.

a. ....

b. ....

ii) බද්ධ අසංගතිය වලක්වා ගැනීමට ගත හැකි ක්‍රියාමාර්ගයක් සඳහන් කරන්න.

....

E වර්ථමානයේ දී පැළ විශාල සංඛ්‍යාවක් ලබාගැනීමට ක්ෂුද්‍ර ප්‍රචාරණය බහුලව භාවිතා වේ

i) ක්ෂුද්‍ර ප්‍රචාරණයේ මූලධර්මය සඳහන් කරන්න.

....

....

....

ii) ක්ෂුද්‍ර ප්‍රචාරණය මගින් වෛරස් වලින් තොර පැල ලබා ගත හැකිය. ඊට හේතුව පහදන්න.

....

....

iii) ක්ෂුද්‍ර ප්‍රචාරණය බහුලව යොදා ගන්නා ආර්ථික බෝග 02ක් නම් කරන්න.

a. ....   b. ....

Click & Visit Our Site
ALapiedu.com

මෙම තීරයේ කිසිවක් නොලියන්න

F සිරස් වගා මළුවල වගා ක්‍රමයක දළ රූප සටහනක පහත දළ රූප සටහනක පහත දැක්වේ.

i) මේ ක්‍රමය සඳහා යොදාගත යුතු පොලිතීනයේ ප්‍රභාභායනය වැළැක්වීම සඳහා තිබිය යුතු ගුණාංගයක් සඳහන් කරන්න.

....

ii) සිරස් වගා මළු සකස් කිරීම සඳහා යොදා ගන්නා පොලිතීනයේ ඇතුළත, පිටත වර්ණය සඳහන් කර එම වර්ණ භාවිතයට හේතුවක් බැගින් සඳහන් කරන්න.

	වර්ණය	හේතුව
ඇතුළත	....	....
පිටත	....	....

G කාලගුණික දත්ත ලබා ගැනීම සඳහා උපකරණ පිහිටුවා ඇති ස්ථානයක් කාලගුණික ඒකකය වේ.

i) පහත රූප සටහන්වල දක්වා ඇති උපකරණ මඟින් මනිනු ලබන කාලගුණික පරාමිතීන් සඳහන් කරන්න

a

b

c

a. ....

b. ....

c. ....

ii) ඉහත උපකරණ අතුරින් ස්ටීවන්සන් ආවරණය තුළ තැබිය යුතු උපකරණ වනුයේ,

....

iii) ඉහත උපකරණ ස්ටිවන්සන් ආවරණය තුළ තිබීමට හේතුව සඳහන් කරන්න

....

....

iv) කාලගුණික දත්ත මධ්‍යස්ථානයක දත්ත සටහන් කරනු ලබන සම්මිත වේලාවන් සඳහන් කරන්න.

....

....

Click & Visit Our Site
ALapiedu.com

මෙම තීරයේ කිසිවක් නොලියන්න

H පහත සඳහන් ප්‍රකාශ සත්‍ය නම් (✓) ලකුණ ද අසත්‍ය නම් (✗) ලකුණ ද යොදනන.

i) සෑම විටම ගොඩබිම් ශාකවල ප්‍රභාසංස්ලේෂණය ක්‍රියාවලියේ සීමාකාරී සාධකය ජලයයි	
ii) ශාකයක් මගින් අවශෝෂණය කර ගන්නා ජලය වැඩිම ප්‍රමාණයක් උත්ස්වේදනය මගින් නැවත ශාකයෙන් පිටවේ.	
iii) Si ඌනතාවය නිසා වී ශාකයක උස්වේදන සීඝ්‍රතාවය අඩු වන අතර Si උපකාරක මූලද්‍රව්‍යයක් ද වේ.	
iv) තවාන් පාත්ති වසුන් කිරීමේ දී උෂ්ණත්වය ඉහළ යාම නිසා බීජ ප්‍රරෝහණය ඉක්මන් වේ.	

03. A එළදෙනුන්ගෙන් කිරි දෙවීම ප්‍රධාන ආකාර දෙකකට සිදු කරයි.

පහත දැක්වෙන්නේ එළ දෙනුන්ගෙන් කිරි දෙවීම සඳහා යොදාගන්නා යන්ත්‍රයක කොටස් දැක්වෙන රූපසටහනකි.

i) රූපයේ A, B, C කොටස් නම් කරන්න.



A - ....

B - ....

C -...

ii) A ව්‍යුහයේ තිබිය යුතු ගති ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

....

....

iii) එහි C කොටස තිබීමේ වැදගත්කම සඳහන් කරන්න.

....

iv) අතින් කිරි දෙවීම හා සැසඳීමේ දී මෙම ක්‍රමයේ ඇති විශේෂිත ආර්ථික වාසියක් සඳහන් කරන්න.

....

B එළදෙනකගේ ක්ෂීරණ පද්ධතියේ ව්‍යුහය අධ්‍යයනය කිරීම පැටවාගේ පෝෂණයට මෙන්ම ආර්ථික වශයෙන් ද ගොවියාට වාසි දායක වේ. එළදෙනකගේ ක්ෂීරණ පද්ධතියේ දළ ව්‍යුහය දැක්වෙන රූප සටහනක් පහත දැක්වේ.



i) රූපයේ P,Q,R,S කොටස් නම් කරන්න.

P .... Q ....

R .... S ....

Click & Visit Our Site
ALapiedu.com

මෙම තීරයේ කිසිවක් නොලියන්න

ii) P ව්‍යුහය තුළ එයට ලැබෙන පොෂක භාවිතයෙන කිරි ස්‍රාවය කරන විශේෂිත සෛල ස්ථරය කුමන නමකින් හැඳින්වේද?

....

iii) එළදෙනකගේ කිරි එරීම උත්තේජනය කරන හෝර්මෝනය ස්‍රාවය වන්නේ කුමන ස්ථානයකින් ද?

....

C ගවයාගේ හා කුකුළාගේ මුඛය තුළදී සිදුවන ආහාර ජීරණ ක්‍රියාවලිය සම්බන්ධව දක්නට ලැබෙන වෙනස්කම් දෙකක් සඳහන් කරන්න.

....

....

D ශාක අභිජනනයේ දී වරණය ඉතා වැදගත් මූලික ක්‍රමවේදයකි. වරණය හැර ශාක අභිජනනයේදී යොදාගත හැකි වෙනත් ක්‍රමවේද තුනක් සඳහන් කරන්න.

a ....

b..

c. ....

E පහත රූප සටහනේ දැක්වෙන්නේ බිංදු ජල සම්පාදන පද්ධතියකි.



i) එහි කොටස් නම් කරන්න.

A .... D ....

B .... E ....

C ....

ii) බිංදු ජල සම්පාදන ක්‍රමයේ අවාසි 2ක් සඳහන් කරන්න.

....

....

iii) වියළි කලාපයේ බිංදු ජල සම්පාදනය භාවිතා කරන පළතුරු බෝග 2ක් සඳහන් කරන්න.

a .... b ....

iv) මෙම ජල සම්පාදන පද්ධතියේ ජලය කාන්දුවීම් නිසා 5cm ක් හානි වේ. මෙම බෝගයේ දළ ජල සම්පාදන අවශ්‍යතාවය 25cm කි. පද්ධතියේ ජල සම්පාදන කාර්යක්ෂමතාවය කොපමණද?

....

....

....

Click & Visit Our Site
ALapiedu.com

මෙම තීරයේ කිසිවක් නොලියන්න

F සන මාධ්‍ය නිර්පාංශු වගා මාධ්‍ය සඳහා භාවිතා කළ හැක පහත සඳහන කාණ්ඩ වලට අයත් ද්‍රව්‍යයක් බැගින් නම් කරන්න.

i) අකාබනික ස්වාභාවික මාධ්‍යය ....

ii) කාබනික ස්වාභාවික මාධ්‍යය ....

iii) අකාබනික කෘතිම මාධ්‍යය ....

iv) කාබනික කෘතිම මාධ්‍යය ....

G ආහාර පරිරක්ෂණයේ දී ආහාර නරක් වීම කෙරෙහි බලපාන සාධක පාලනය කරනු ලබයි.

i) පහත දැක්වෙන ආහාර වර්ග පරිරක්ෂණය සඳහා යොදාගන්නා ආහාර පරිරක්ෂණ මූලධර්මය සඳහන් කරන්න.

a. වියළන ලද බිම් මල් ....

b. යෝගට් ....

c. කල්කිරි ....

d. ජෑම් ....

ii) අධිශීතනයේ දී සිදුවන පහත ක්‍රියාවලි පාලනයට යොදාගත හැකි ක්‍රියාමාර්ගය බැගින් සඳහන් කරන්න.

a. එන්සයිමීය ක්‍රියා පාලනය

....

b. ඔක්සිකරණය වැළැක්වීම

....

04. A කෘෂිකර්මාන්තය පිළිබඳව අධ්‍යයනයේ දී වෙළෙඳ පොළ පිළිබඳ අවබෝධය වැදගත්ය.

i) ශ්‍රී ලංකාවේ වෙළෙඳ පොළ තත්ත්ව ඇසුරින් පහත වෙළෙඳ පොළ වල දැකිය හැකි මොඩල (ආකෘති) නම් කරන්න.

a. එළවළු වෙළෙඳපොළ ....

b. බාස්මතී සහල් වෙළෙඳපොළ ....

ii) සුළු පරිමාණ කෘෂි ව්‍යාපාරයක් සඳහා බලපාන ප්‍රධාන ක්ෂේත්‍ර තුන නම් කරන්න.

a. ....

b. ....

c. ....

iii) අගය දාම ක්‍රියාවලියක උපකාරක සේවා සඳහා උදාහරණ තුනක් නම් කරන්න.

a. ....

b. ....

c. ....

Click & Visit Our Site
ALapiedu.com

මෙම තීරයේ කිසිවක් නොලියන්න

iv) විවිධ මිල මට්ටම් යටතෙ ඉලලුම හා සැපයුම ප්‍රමාණ පහත වගුවෙ දැකවෙ. ද් ඇති දත්ත ඇසුරින් හිස්තැන් පුරවන්න.

මිල රු.	ඉල්ලුම් ප්‍රමාණ කි.ග්‍රෑ.	සැපයුම් ප්‍රමාන කි.ග්‍රෑ.	අතිරික්ත ඉල්ලුම කි.ග්‍රෑ.	අතිරික්ත සැපයුම කි.ග්‍රෑ.
17	34	22		
18	32	26		
19	30	30		
20	28	34		
21	26	38		

v) ඉහත දත්ත ඇසුරින් ඉල්ලුම් හා සැපයුම් වක්‍ර ප්‍රස්ථාරිකව දක්වන්න.



vi) ඉහත වෙළෙඳ පොළේ සමතුලිත අවස්ථාවට අදාළව සැපයුම් හා ඉල්ලුම් ප්‍රමාණ දක්වන්න.

සැපයුම ....

ඉල්ලුම ....

B බෝග අස්වැන්නේ ගුණාත්මය හානි වීම කෘෂිකර්මාන්තයේ නියැලෙන්නන්ට අහිතකරව බලපායි.

i) අස්වැන්නේ ගුණාත්මයට, ප්‍රමාණයට බලපාන ප්‍රධාන පසු අස්වනු සංරචක සඳහන් කරන්න.

....

....

....

C කෘමීන්ගෙන් බෝග ශාකවලට සිදුවන හානිය සැලකීමේ දී ඔවුන්ගේ මෞඛ උපාංග පිළිබඳව දැනුවත් වීම වැදගත් වේ. පහත දැක්වෙන්නේ කෘමියෙකු ගේ දර්ශීය මෞඛ උපාංග පිළිබඳ දළ සටහනකි.



i) රූපයේ A,B,C,D කොටස් නම් කරන්න.

A - ....

B - ....

C - ....

D - ....

Click & Visit Our Site
ALapiedu.com

මෙම තීරයේ කිසිවක් නොලියන්න

ii) බෝග වගාවට කෘමින සදුකරන හානයෙ සවාභාවය අනුව ප්‍රධාන මුඛ කොටස් ආකාර 3 නම් කරන්න.

a. .... b. ....

c. ....

iii) ඔබ ඉහත නම් කළ මුඛ කොටස් මඟින් සිදු කරනු ලබන හානියක් බැගින් සඳහන් කරන්න.

a. ....

b. ....

c. ....

D වෙනත් පරිසර පද්ධතියක ජන්මය ලබා විවිධ ක්‍රම ඔස්සේ මෙරටට පැමිණ ස්ථාපිත වන පැළෑටි ආගන්තුක ආක්‍රමණකාරී වල් පැළ කාණ්ඩයට අයත් වේ.

i) ආගන්තුක ආක්‍රමණකාරී වල්පැළෑටි මෙරටට පැමිණෙන ආකාර දෙකක් සඳහන්කරන්න.

....

....

ii) මෙම වල් පැළෑටි මර්ධනය කිරීමට අපහසු වී ඇත්තේ මන්දැයි පැහැදිලි කරන්න.

....

....

* * * *

Click & Visit Our Site ALapiedu.com

ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ஊவா மாகாண கல்வித் திணைக்களம்
Uva Provincial Department of Education

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය - පෙරහුරු පරීක්ෂණය - 2025
General Certificate of Education (Adv. Level) Examination - Practice Test - 2025

කෘෂි විද්‍යාව II
விவசாய விஞ்ஞானம் II
Agricultural Science II

08 S II

B කොටස - රචනා

උපදෙස් :

- ❋ ප්‍රශ්න **හතරකට** පමණක් පිළිතුරු සපයන්න.
- ❋ එක් ප්‍රශ්නයකට ලකුණු **150** බැගින් හිමි වේ.
- ❋ අවශ්‍ය තැන්හි දී නම් කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න

05 i බීජ සුප්තතාවයට බලපාන විවිධ හේතු විස්තර කරන්න.

ii සෞඛ්‍යවත් පසක පෝෂක සුලබ වන ආකාරය පැහැදිලි කරන්න.

iii වගා ක්ෂේත්‍රයකට ජල සම්පාදනය කිරීමේ දී බලපාන සාධක විස්තර කරන්න.

06 i ආහාර කර්මාන්තයේ දී ප්‍රමිති වල වැදගත්කම විස්තර කරන්න.

ii එළදෙනක ගේ මද චක්‍රය තුළ දී හෝර්මෝන වල සිදු වන වෙනස්කම් පැහැදිලි කරන්න.

iii බෝග වගාවේදී යොදාගන්නා තාවකාලික ප්‍රචාරක ව්‍යුහ ආකාර විස්තර කරන්න.

07 i කුකුළු පාලනයේ දී අවශ්‍ය ප්‍රමාණයට වඩා ඉඩකඩ අඩුවීමෙන් ඇතිවන ගැටලු පැහැදිලි කරන්න.

ii කෘෂිකර්මාන්තයේ දී මුහුණ දීමට සිදුවන තාක්ෂණය ආශ්‍රිත අභියෝග මග හරවා ගන්නා අන්දම විස්තර කරන්න.

iii කොම්පෝස්ට් සෑදීමේ පියවර විස්තර කරන්න.

08. i පාංශු සෞඛ්‍ය පිරිහීම වර්තමානයේ කෘෂිකර්මාන්තය මුහුණ දී ඇති ප්‍රධාන ගැටලුවකි. එයට විසඳුමක් ලෙස තිරසාර කෘෂිකර්මාන්තයේ භාවිතයන් පැහැදිලි කරන්න.

ii කෘෂි ආර්ථික ක්‍රියාවලියක ඵලදායීතාවයට අගය දාම විශ්ලේෂණ ක්‍රියාවලිය බලපාන ආකාරය පැහැදිලි කරන්න.

iii කෘෂිකාර්මික කටයුතු වලදී වර්ධක යාමක ඵලදායීව භාවිතා කරන අවස්ථා පැහැදිලි කරන්න.

09. i ජාන සම්පත් හායනයට බලපාන විවිධ හේතු විස්තර කරන්න.

ii වී වගාව සඳහා බිම් සකස් කරන ආකාරය පැහැදිලි කරන්න.

iii වගා ක්ෂේත්‍රයක රෝග කළමනාකරණය සඳහා රෝග ත්‍රිකෝණයේ වැදගත්කම විස්තර කරන්න.

10. i කෘෂි ව්‍යාපාරයක නිෂ්පාදන වක්‍ර ඇසුරින් නිෂ්පාදන කලාප සංකල්පය විස්තර කරන්න.

ii ආගන්තුක ආක්‍රමණකාරී වල් පැළෑටි මෙරට ස්ථාපිත වීම සඳහා ඒවා සතු අනුවර්තන පැහැදිලි කරන්න.

iii ශ්‍රී ලංකාවේ පළතුරු එළවළු වෙළෙඳ පොළෙහි මිල උච්චාවචනය පාලනය කිරීමේ දී පරිණත දර්ශකවල වැදගත්කම පැහැදිලි කරන්න.